
# තෑග්ග



ජිතුලි බුලත්සිංහල

# තෑග්ග

කර්තෘ: ජිතුලි බුලත්සිංහල

ISBN 978-624-208-239-4

පළමු පිටපත හා මුද්‍රණය

2024.02.08

කතාව හා චිත්‍ර

ජිතුලි බුලත්සිංහල

කතෘගේ වෙනත් කෘති

අක්කරු සඳුනි

මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර.

# පිදුම

අයනු ආයනු කියා දී වචන
ගළපන්නට, වාක්‍ය තනන්නට
මට කියාදුන් මගේ ආදරණීය
**ප්‍රමිතා වෙත්තසිංහ ගුරු
මැණියන්ටත්,නිලුෂිකා ගරුසිංහ
ගුරු මැණිටන්ටත්,මාගේ
ආදරණීය දෙමාපිටන්ටත්** මේ
පොත් පිංච ආදරයෙන්
පුදකරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ,දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ෂ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්විම සුවිශේෂ සිදුවිමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී”ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක  වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබිම එහි විදුහල්පතිනිය  වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වේ.ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවිමේ  ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එකමත් එක කාලෙක සහන් කියලා ළමයෙක් හිටියා. මෙයාට හිටියා අම්මයි,තාත්තයි,මල්ලියි.



මෙයාලට ගොඩක් සල්ලි තිබුනේ නැහැ. ගොඩක් මහන්සි වෙලා තමයි එයාගේ අම්මයි තාත්තයි ජීවත් වෙන්න සල්ලි හොයා ගත්තේ.



සහන් හරි කීකරුයි. අම්මා තාත්තා කියන දේ හොදින් ඇහුවා. හැබැයි එයාගේ මල්ලී නම් ටිකක් අකීකරුයි. අම්මාගෙන් තාත්තාගෙන් නිතරම වගේ බැණුම් ඇහුවා.

.




මෙහෙම කාලයක් ගත වෙද්දී දවසක් සහන්ගේ අම්මා තාත්තාට කීවා "අපි මේ සති දෙක තුනේ ඉතිරි කර ගත්ත සල්ලි වලින් පොඩි ප්‍රමාණයක් අරගෙන සිදාසියේ වෙළඳ සැලකට ගිහින් ගෙදරට ඕන කරන බඩු ටිකක් ගේමුද කියලා "සහන්ගේ තාත්තාත් ඊට එකඟ වුනා. මොකද සහන්ලත් ගොඩක් කාලෙකින් සිදාදියට ගිහින් නැති නිසා.




ඔන්න ඒ දවස උදා වුනා. සහනුයි සහන්ගේ මල්ලියි හිටියේ හරිම සතුටින්. සහනුයි මල්ලි දෙන්නා අත්දෙක අල්ලාගෙන අම්මගෙයි තාත්තගෙයි පිටුපසින් ගියා. මෙන්න මෙහෙම යනකට සහන්ගේ මල්ලි දැක්කා පාරේ කාණුව අසල මුදල් පසුම්බියක් වැටිලා තියෙනවා.


එයා එම මුදල් පසුම්බිය අතට අරගෙන බැලුවා. එම පසුම්බියේ මුදල් ඇති බව ඔහු දැක්කා.

"අයියා අපිට ඕන හැමදේම අපි මේ සල්ලි වලින් ගමු " මල්ලි කිවා. "






එහෙම කරන්න බැ සහන් කිවා. සහන් පසුම්බිය අත්ට ගත්තා. එය පරික්ෂා කිරිමේදි එහි තිබී දුරකථන අංකයක් ඔහුට හමුවුනා.



තාත්තාට සියලු දේ පැවසූ සහන් මුදලාලි මාමාට කියා දුරකථන ඇමතුමක් ඒ අංකයට ලබා ගත්තා. මාමා කෙනෙක් කතා කරලා කීවා “ඔතනම ඉන්න මම එන්නම් පුතා” කියලා.



සුලු වෙලාවකින් එතනට පැමිණි ඔහු එම මුදල් පසුම්බිය ලබා ගෙන සහන්ගේ පියාටත් මවටත් ස්තුතිවන්ත වුනා මේ වගේ යහපත් ගතිගුණ ඇති දරුවෙක් හැදුවට.සහන්ගේ මේ හොඳ ගතිගුණය නිසා ඒ මහත්තයා සහන්ට බයිසිකලයක් තෑගි දුන්නා.



නිමි.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන වාට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරිමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්විමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත් ,ජාතික සහ ජාත්‍යන්තරලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි.මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය,දියණියන්,ගුරුභවතුන්,දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් විමත් සමඟ දරුවන් එයින් දුරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුල විවිධ ප්‍රශ්න ගැටලු නිර්මාණය විමට හේතු වි ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිඩිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මාහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ,සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලෙඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනවිරත්න මහලේකම්.